# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/05 – 2023 ඔක්තෝබර් මස 30 වැනි සඳුදා – 2023.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2020/212.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මයා, අයි. සී. එම්. බංගලාව, රාමලංකාවත්ත, නුගතලාව.

*සහ*

01. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ - 05.

02. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බස් සමවාය, අංක 03, මයිලගස්තැන්න පාර, බදුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී


1A – G 40634 – 16 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තේගොඩ, කුඩමාඩුව, ද විල්ලේජ්, අංක 202/බී/61, නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/04/2020/212.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මයා, අයි. සී. එම්. බංගලාව, රාමලංකාවත්ත, නුගතලාව.

*සහ*

01. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ - 05.
02. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, බස් සමවාය, අංක 03, මයිලගස්තැන්න පාර, බදුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බදුල්ල බස් සමවායේ සේවය කරන එච්. එම්. කේ. කුඩාබණ්ඩාර මහතාට 2015.11.30 දිනැති ලිපිය මගින් කාර්යභාර ඉංජිනේරු තනතුර ආවරණය කිරීම සඳහා කරන ලද පත් කිරීම මෙතෙක් ස්ථිර නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම්, හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳ ව වේ."

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 00296

---

මගේ අංකය: IR/COM/02/2021/166.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එච්. එම්. එන්. ජී. එම්. පී. හේරත් මිය ඇතුළු සේවකයින් දස දෙනෙක්, අංක 425, කන්දෙවත්ත, කු/ලබ්බල, ලබ්බල.

*සහ*

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය, (ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ආයතනයකි) තේමා උද්‍යාන ගොඩනැගිල්ල, මීගමු පාර, පැලියගොඩ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කලල්ගොඩ පාර, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණය, අංක 15, කැප්ටන් එම්. ජී. ජී. මෙන්ඩිස් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2021/166.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. එම්. එන්. ජී. එම්. පී. හේරත් මිය ඇතුළු සේවකයින් දස දෙනෙක්, අංක 425, කන්දෙවත්ත, කු/ලබ්බල, ලබ්බල.

*සහ*

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය,(ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ආයතනයකි) තේමා උද්‍යාන ගොඩනැගිල්ල, මීගමු පාර, පැලියගොඩ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

"ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවය කළ එච්. එම්. එන්. ජී. එම්. පී. හේරත් මිය ඇතුළු පහත නම් සඳහන් සේවකයින් දස දෙනාගේ සේවය අවසන් කිරීම මගින් ඔවුන්ට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ".

1. එච්. එම්. එන්. ජී. එම්. පී. හේරත් මිය
2. ඩබ්. ජේ. ඒ. ජී. උදේශිකා මිය
3. ඩබ්. එම්. පුප්ෂා කුමාරි වනිගසේකර මිය
4. ඒ. එම්. සුගත් බණ්ඩාර මයා
5. ඒ. එච්. සඳනිකා මිය
6. ඩබ්. ජී. ඒ. මධුමාල් මයා
7. එම්. ඩී. අජිත් පුෂ්පකුමාර මයා
8. බී. පී. රුවන් මයා
9. බී. පී. ඩී. කුමාර මයා
10. ජේ. එම්. නාලක ජයසිංහ මයා

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0297

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.